

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **58 වන කාණ්ඩය** | **බු.ව. 2559 වප් මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2015 ඔක්තොම්බර් මස 27 වන ද** | **06 වන කලබ** |



සාජයෙන් දිනු - තේජවන්ත වූ
පුරාණ සිංහලුන් - ගේ විකුම් බලවු

කාලයෙන් ඉතා - පුරාණ වූ නමුත්
අදත් එදා වගේ - ජීවමාන වේ

සිංහලයි නමක් - මේ පොළෝ තලේ
ඇතොත් උදාර වී - ඒ විකුම් නිසයි

උදාර සාර වූ - පුරාණයන් ගෙ ඒ
විකුම් තැකුම් කරවු - ස්වජාති ආලයෙන්

**ටිබෙට් එස්. මහින්ද හිමි**



# මහා අරිට්ඨ මහරතන් වහන්සේ

## (අදින් වසර ගණණකට පෙර අදවන් පොහෝ දිනක ලක්දිව සිදු වූ අසිරිමත් විනය සංගායනාව සමරන වස්

අපවත් වී වදාළ මහාචාර්ය පූජ්‍ය ධම්මවිහාරි ස්වාමිපාදයන් වහන්සේ විසිනි.

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලක් මිහිතලය මත රෝපණය කරන ලද බුදුසසුන මුල් බැස ගන්වාලීමේ කාර්යය ඉටුකළෝ මේ අරිට්ඨ මහරහතන් වහන්සේ ය. එතුමන් ඉතිහාසය තුළින් සම්භාව්‍ය ලෝකය ඉදිරියට පා තබනුයේ ගිහි ව සිටි කාලයේ ම ය. දඹදිව ධර්මාශෝක නරපතියනුත් සිරිලක දෙවනපෑතිස් රජතුමනුත් අදිට්ඨ සහාය හෙවත් නුදුටු මිතුරන් බව කවුරුත් දනිති. විස්මයජනක අයුරින් තමනට හිමි වූ (මහාවංශය. xi. 8 - 18) විවිධ මුතු මැණික් ආදි රත්නයන්ගෙන් කොටසක් තම මිතුරා වෙත යවනු රිසිවූ දෙවනපෑතිස් රජතුමා මේ සඳහා යවන දූත පිරිසේ නායකයා හැටියට තෝරාගත් තම බෑනණුවන් වූ (භාගිනෙය්‍ය) මහාරිට්ඨ කුමරුවෝ මුන්වහන්සේ ගේ ගිහි ජීවිතයේ මුල් අවධිය හෙළි කරති. (මහාවංශය. xi. 20) රාජ්‍ය තානාපතිවරයෙකු ලෙස යෑමට සියලු හිමිකම් ඇති ව සිටි මේ අරිට්ඨ කුමරුවනට සෙන්පති තනතුරක් පිරිනමමින් අශෝක අධිරාජයා රාජ සම්මානයෙන් සංග්‍රහ කළේ ය. (මහාවංශය. xi. 25) ගිහි ව සිටි කාලයේත් උන් වහන්සේ භාග්‍ය සම්පන්න බවට මේ කරුණු දෙස් දෙයි.

මේ අතරතුර අරිට්ඨ නම් වූත් ඇමති කෙනෙකු වූත් රජු ගේ තවත් බෑනා කෙනෙක් (භාගිනෙය්‍යොව රාජිනො මහාරිට්ඨො මහාමච්චො ... මහාවංශය. xvi. 9 - 10) මිහිඳු හිමියන් වස් එළඹෙන්නට සැරසෙන බව දැන වැඩිමහලු බාල සොහොවුරන් පනස්පස්දෙනෙකු සමඟ රජුගෙන් අවසර ගෙන තෙරුන් වෙත පැවිදි ව එදවස් ම රහත් බවට පත්වූහ. මේ අප කලින් සැලකිල්ලට යොමු කළ මහා අරිට්ඨ ඇමැති නොවන බව මින් පැහැදිළි වෙයි.

ලක්දිව බුදු සසුනේ වේගවත් වර්ධනයට තුඩු දුන් අනුලා දේවීන් ප්‍රමුඛ කාන්තා උද්යෝගයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට මෙහෙණි සසුනක් පිහිටුවීම සඳහා සඟමිත් තෙරණිය ද මෙරට බොදු සවුවන්ගේ වැඳුම් පිදුම් සඳහා සිරිමා බෝ සමිඳුන්ගේ ශාඛාවක් ද මෙහි වැඩම කරවාලීමේ අවශ්‍යතාව පැනනැඟුණු තැන ඒ සඳහා අශෝක රාජසභාවට නැවත දූත පිරිසක් යැවීමට සැරසෙමින් ඒ සඳහා කලින් ලද පලපුරුද්දක් ඇති තම බෑනණුවන් වූ මහාඅරිට්ඨ ඇමතියන් නැවැත කැඳවා 'දරුව, එහි ගොස් සඟමිත් තෙරණියනුත් මහාබෝධීන් වහන්සේත් වැඩම කරනු හැකි දැ'යි (මහාබෝධිං සංඝමිත්තං ථෙරිං ආනයිතුං ඉධ..... මහාවංශය. xviii. 4) විමසුයේ ය. 'මහ රජ, ඒ සියල්ල රැගෙන මෙහි පෙරළා ආ කල්හි පැවිදි වීමට මට අවසර ලැබෙන්නේ නම් කැමැත්තෙමි' යි ස්ථිරවූත් බලාපොරොත්තු සහිතවූත් පිළිතුරක් ඒ අරිට්ඨ ඇමැති තුමා දුන්නේ ය. ශාසනික මෙන් ම ජාතික අතින් ද ඉතා වැදගත් පියවරකිල මෙහිදී මේ ගනු ලැබුයේග රජතුමා ද එසේ ම වේවා යි තමන්ගේ අනුමැතියත් අනුග්‍රහයත් පිරිනැමී ය.

තමන් බාරගත් වගකීම මහා අරිට්ඨ ඇමැතිතුමන් විධිමත් ව අකුරට ම ඉටුකළෙන් (මහාවංශය. xviii. 14) සඟමිත් තෙරණියෝ ද ශ්‍රී මහා බෝධි ශාඛාව ද යථා කාලයෙහි මෙරටට වැඩම කරනු ලැබූහ. ලක්දිව ජනතාවගේ හිත සුව

පිණිස බෝධි ශාඛාව මෙහි පිහිටුවීමත් (දීපවාසිජනස්සෙවං හිතත්ථාය පතිට්ඨිතෙ මහාබොධිදුමින්දම්හි... මහාවංශය. xix. 64) සඟමිත් තෙරණියන් වෙත පිරිස සහිත අනුලා දේවිය ගේ පැවිදිවීමත් සිදුවීමට අනතුරු ව ප්‍රභූ නාමයෙන් අප පුදනු කැමැති ඒ මහා අරිට්ඨ ඇමති තුමා පන්සියයක් පිරිවර සමඟ මිහිඳු මාහිමියන් වෙත පැවිදි ව රහත් බව ලැබී ය. නිතැතින් බුදුසමය උරුම කොට උපදින සිංහල කොයි කාහට වුවත් පැතිය යුතු වූත් පිදිය හැකි වූත් වීරත්වයේ උසස් අධිගමය මෙය ම විය යුත්තේ නො වේ ද?

අරිට්ඨ මහරහතන් වහන්සේ පිළිබඳ මෙතෙක් දැක්වූ කථා පුවත අවසන් කරන අපේ මහාවංශ කතුවරයාණන් ගේ අවසාන ප්‍රකාශය ද සලකා බැලීම වටී. මිහිඳු මාහිමියාණන් ප්‍රමුඛ ඒ පස් මහ තෙරුන් ද අරිට්ඨ තෙරුන් ද ඇතුළු බොහෝ දහස් ගණන් වූ රහතන් වහන්සේලා ද සඟමිත් තෙරණියන් ප්‍රමුඛ දෙළොස් තෙරණියන් ඇතුළු දහස් ගණන් රහත් බවට පත් තෙරණියෝ ද ලක්දිව විනයාදි බුදු බණ දෙසමින් සසුන බැබළවූවාහු ය.

ශාසන ප්‍රතිෂ්ඨාපනයෙහි හා ව්‍යාපෘතියෙහි පුරෝගාමී වූ හෙළ තෙර නමක් ලෙස මහාවංශ කතුවරයා හඳුන්වන අපේ මහා අරිට්ඨ මහ රහතන් වහන්සේ පිළිබඳ අපේ ම ශාසනික වාර්තාවක් වන සමන්තපාසාදිකා නම් වූ විනය අටුවාව තවත් අංශයකින් මහා අරිට්ඨ චරිතය ආලෝකවත් කරයි. දෙවන පැතිස් රජතුමා තමා සසුන වෙනුවෙන් කළ විවිධ සේවාවනට අනතුරු ව 'දැන් ඉතින් ස්වාමීනි. ලක්දිව බුදුසසුන පිහිටියේ වේද'යි මිහිඳු මාහිමියන්ගෙන් විමසූ කල 'සසුන නම් මහරජ පිහිටියේ ය. එහෙත් මුල් නම් තව ම යටට බැස නැතැ'යි පිළිවදන් දුන් සේක. කවරද නම් එය වේ දැයි තවදුරටත් ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙන උන් වහන්සේ 'යම් දවසක ලක්වැසි දෙමාපියන්ගේ ලක්දිව උපන් දරුවෙකු

මෙහි ම පැවිදි ව මෙහි ම විනය උගෙන මෙහි ම එය කියන්නේ වේ ද, එද සසුන මුල් බැසගත්තා නම් වන්නේ යයි හෙළි කළේ ය. එවන් කෙනෙක් මෙහි ඇද්ද' යි රජතුමා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙන මිහිඳු මාහිමියෝ මේ කටයුත්ත කළ හැකි අරිට්ඨ නම් භික්ෂුවක් ඇතැයි කියමින් මෙහි දී අපේ මහා අරිට්ඨ මහ රහතන් වහන්සේ හඳුන්වා දෙති.

මහා අරිට්ඨ මහරහතන් වහන්සේ ප්‍රමුඛ ව ලක්දිව කැරුණ විනය සංගීතියට මඟ පෑදුණේ මෙසේ ය. ඉන් දිරිගැන්වුණු දෙවනපෑතිස් රජතුමා පළමු සංගීති කාලයෙහි අජාතසත්තු මහ රජතුමන් පිරිනැමූ අනුග්‍රහයට දෙ වැනි නො වන පරිද්දෙන් අවශ්‍ය මණ්ඩපාදිය සාදවා මහා විනය සංගීතියකට සූදානම් විය. සමන්තපාසාදිකා විස්තරයට අනුව හැටඅටදහසක් භික්ෂූහු මේ සඳහා ථූපාරාමයයෙහි රැස් වූවාහු ය. ධර්මාසනාරූඪ ව සිටි මහා අරිට්ඨ තෙරුන් වටා මිහිඳු මාහිමියන් ප්‍රමුඛ මහතෙරවරු හැටඅට නමක් අසුන් ගත්තාහු ය. රජුගේ බාල සොහොවුරු මත්තාභය තෙරහු පන්සියයක් භික්ෂූන් සමඟ විනය ඉගෙනගනු අටියෙන් එහි මුල් තැන ගෙන සිටියාහ. සෙසු භික්ෂූහු ද සරාජික පිරිස ද තම තමන්ට පැවරුණු අසුන් ගෙන සිටියා හ. එහි වූ සංවිධානමය සිරිය උත්කර්ෂණීයයි. මිහිඳු හිමියන්ගේ ඉල්ලීම පරිදි මහා අරිට්ඨ තෙරණුවෝ සිත්ගන්නා විවිධ ප්‍රාතිහාර්ය මැද්දෙහි විනය සංගායනය ඇරඹූ සේක. බුදුන් වදාළ පරිදි කය වචන යන ද්වාරද්වයෙන් සිදුවන වැරදි වළකාලනු සඳහා පණවා වදාළ විනය පිටකය මෙසේ කියා හෙළි කළ සේකැයි සමන්තපාසාදිකාව මේ සිද්ධිය වාර්තා කරයි. තිස්සදත්ත, කාළසුමන, දීඝසුමන ආදි මහ තෙරවරුන් මෙන් ම මහා අරිට්ඨ තෙරණුවන්ගේ ගෝළයෝත් ගෝළයන්ගේ ගෝළයෝත් අනුපිළිවෙළින් ලක්දිව විනය සම්ප්‍රදායයේ පැවැත්ම රැකගත්තාහු ය.



# සත්පුරුෂ ධර්මය

**අපවත් වී වදාළ අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය වැලිගම ඥාණරතන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

ශාන්තිනායක බුදුරජාණන් වහන්සේ සුවාසූ දහසක් දහම් කඳු දෙසූ සේක. එය සර්වසම්පූර්ණ ය, ප්‍රඥාගොචර ය, හැම සත්නට සැනැසිලි දයක ය. ඒ අති උතුම් ධර්මය අතර සත්පුරුෂයකු කෙරෙහි පිහිටා තිබිය යුතු ගුණ සතක් අංගුත්තර නිකායයෙහි සත්තක නිපාතයෙහි ප්‍රකාශ වන්නේ ය. හැමවිට ම උතුම් සත්පුරුෂයකු වීමට මහන්සි දරන ඔබ ඒ සත්පුරුෂ ධර්ම ඉගෙන පිළිපදිත්වා!

"සත්තිමෙ භික්ඛවෙ සද්ධම්මා; කතමෙ සත්ත? සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, බහුස්සුතො හොති, ආරද්ධ විරියො හොති, සතිමා හොති, පඤ්ඤවා හොති, ඉමෙ ඛො භික්ඛවෙ සත්ත සද්ධම්මා"

මහණෙනි. මේ සද්ධර්මයෝ සත් දෙනෙක් වෙත්. කවර නම් සත්දෙනෙක් ද? යත්ඃ සැදැහැත්තේ වේ ද, බොහෝ ඇසූපිරූතැන් ඇත්තේ වේ ද, ඇරඹූ වැර ඇත්තේ වේ ද, සිහි ඇත්තේ වේ ද, නුවණැත්තේ වේ ද, මහණෙනි, මේ වනාහි සත්වැදෑරුම් සද්ධර්මයෝ යි.

සද්ධර්මයෝ නම් සත්පුරුෂයන් ගේ ධර්මයෝ යි. "සතං ධම්මා - සන්තා වා ධම්මා සද්ධම්මා" යන අටුවා පාඨයෙන් ඒ බව හොඳින් පැහැදිලි වෙයි.

## සැදැහැති බව

මේ ප්‍රථම සත්පුරුෂ ගුණය යි. බුදුරජාණන් වහන්සේ පිළිබඳ නව අරහාදි ගුණ විශ්වාස කිරීම සැදැහැති බව යි. සැදැහැති බව ලැබෙන්නේ බෞද්ධයන්ට පමණකි. "සද්ධා"නම් කවරෙක් ද? යන මේ ප්‍රශ්නය බුදුරජාණන් වහන්සේ විසඳන්නේ " සද්ධො හෝති සද්දහති තථාගතස්ස බෝධිං; ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලෝකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී, සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාතී" යන වශයෙනි. තථාගතයන් වහන්සේ පිළිබඳ නව අරහාදී බුදුගුණ විශ්වාස කිරීම ම සැදැහැති බව ය යි මෙයින් කාටත් වැටැහෙන කරුණකි. බුදුසසුනින් බැහැර අන් ආගම්වල ශාස්තෘවරුන් කෙරෙහි ඇතිකැර ගන්නා වූ භක්තිය හෝ විශ්වාසය "ශ්‍රද්ධා" නම් නො වේ ම ය. අන් සමයන්හි හැඳින්වෙන දෙවියන් වහන්සේ කෙරෙහි හෝ වෙන ශාස්තෘවරයකු කෙරෙහි හෝ භක්තිය දියුණු කිරීමේ අදහසින් ඒ ඒ ආගම්වල පූජකයන් විසින් "ශ්‍රද්ධාව ඇති කර ගන්නටය" යි සිය අනුගාමිකයන්ට කොතෙක් කීවත් ඔවුන් බලාපොරොත්තු වන අදහස එයින් ලැබෙන්නේ නැත. එසේ කියන විට ඔවුන් කියන්නේත් බුදුරජාණන් වහන්සේගේ ගුණ විශ්වාස කරන්නට ය" කීම මැයි. "සද්ධා" යන්නෙහි වෙන කිසි ම තේරුමක් නැත. බුද්ධරත්නය විශ්වාස කරන්නා ධර්මරත්නය ද ධර්මරත්නය විශ්වාස කරන්නා සංඝ රත්නය ද, විශ්වාස කරයි. සැදැහැත්තා නම් මේ තෙරුවන් ගුණ දැන අදහන්නා යි. යම් පින්වතකුට ශ්‍රද්ධාව ඇතිවීම ඔහු ලබන ඉහළ ම ලාභය බව ඝානුත්තරිය සූත්‍රයෙහි පැහැදිලි වේ. මේ ශ්‍රද්ධා ලාභය "ඉහළ ම ලාභය" යි කියන්නේ ශ්‍රද්ධාව ඇත්තකු ම සදෙස් ක්‍රියාත් සදෙස් වචනත් සදෙස් අදහසුත් අත් හැර නිදෙස් ක්‍රියාත්, නිදෙස් වචනත් නිදෙස් සිතුවිලිත් පුරුදු කරන හෙයිනි. ශ්‍රද්ධාව පහළවීමෙන් සිත්සතන් පිරිසිදු වන්නේ ය. සක්විති රජුන්හට උදකප්‍රසාද

මාණික්‍යයක් තිබේ. එය කැලැත්වූ මඩ සහිත දියට ලූ විට දියෙහි මඩගති පහ වැ පිරිසිදු වන්නේ ය. එසේ ම සිත්හි පවත්නා කෙලෙස් කැලැඹුම්ගති ඉවත් වැ සිත පහන් බවට පැමිණෙන්නේ ශ්‍රද්ධාව පහළ වීමෙනි.

ශ්‍රද්ධාව අතක් සේ ය, අතක් ඇත්තකුට ම මිණිරුවන් ඈ යම්කිසිවක් ගතහැකිය. එසේ ම ශ්‍රද්ධා නමැති අත ඇත්තාට ම දන ශීලාදි ගුණරුවන් ගත හැකිය. වස්තු ඇත්තකුට සුවසේ දිවි ගෙවිය හැක්කාසේ ම ශ්‍රද්ධා නමැති හස්තසාර වස්තු ඇත්තා ම දෙලෝ සැනසීම ලබන්නේ ය. යම්හෙයකින් ලෝක සම්මත ධනයෙන් දිළින්දකු වුවත් ශ්‍රද්ධා ධනයෙන් ධනවත් නම්, ඔහු නොදිළිඳු වූත් නොසිස් වූත් ජීවිතයක් ගෙවන්නෙකි. ඉතා දුර මඟ බැසැ යන්නකු හට මාර්ගෝපකරණ (මඟට පිරිමසින දේ) අවශ්‍ය වන්නේ ය. ඒවා නැත්තකුට මහත් දුක් විඳින්නට සිදුවන්නේය. එසේ ම සංසාර නමැති මහා දීර්ඝ මාර්ගයේ ගමන් කරන්නන්හට ශ්‍රද්ධා නමැති මාර්ගෝපකරණය අවශ්‍ය වන්නේ ය. ශ්‍රද්ධාව නැත්තා සසර දී නොයෙක් දුකට භාජන වන්නේ ය. ශ්‍රද්ධාව බුදුසසුන් කෙතෙහි අමාඵල ගන්වන බීජයකි. එබැවින් නිවන් බලාපොරොත්තු වන හැමදෙන විසින් ම ශ්‍රද්ධාබීජය සිය සිත්හි වවා දියුණු කොට අමාඵල ලබාගනු යෙහෙකි.

ලබන කලාපයට



# “වරද”

අධ්‍යාපන සඟරාවේ සංස්කාරක ධූරීණ වූ
යූ.ජී. පැටිසන් ද සිල්වා මහත්මා විසිනි.

වරද සෙවීම නරක වැඩක් නොවේ. එහෙත් වැරදි කොනින් පටන් ගත් කල එය අනර්ථදායක විය හැකි ය. වරද සෙවීම පටන් ගත යුත්තේ තමා ගෙන් ය. පෘථග්ජන මනුෂ්‍යයන් වශයෙන් අප හැම දෙනාගේ ම කයින් වචසින් හා මනසින් වරද සිදුවේ. එහෙත් දියුණුව අපේක්ෂා කරන්නාවූ හැම ශිෂ්ට මනුෂ්‍යයෙකුගේ ම පරමාර්ථය විය යුත්තේ හැකි තරම් වරදින් මිදීම යි. නිවැරදි මඟ ගමන් කිරීම යි. ආගමත් අධ්‍යාපනයත්, ආශ්‍රයත්, උපදේශයත් වුවමනා වන්නේ ඒ සඳහා යි.

අපෙන් වැරදි සිදු වන බව සැබෑ නම් අපේ පරිශ්‍රමය ඉන් මිදීමට නම්, අප විසින් කටයුතු දෑ කීපයකි. ඉන් වැදගත් වන්නේ වරද වරද සේ පිළිගැනීම යි. නො දන වරද කරන්නා තරමක් වත් සමාව ලැබීමට සුදුස්සෙකි. එහෙත් ඒ නිසාම නිතර වරද කිරීමට ඉඩ නොගත යුතුයි. තමාගෙන් වූ වරද අවබෝධ වූ කල, ඥානවන්තයා එය පිළිගනී. ඒ ගැන කනගාටු වෙයි. මතුවටත් ඉන් බේරී සිටීමට ප්‍රවේසම් වෙයි. ස්වයං විවේචනයෙන් යුක්ත වෙයි. දෙමවුපිය, ගුරුවර ආදීන්ගේ උපදෙස් සොයයි. ආගමික ප්‍රතිපත්ති අනුගමනය කරයි.

වරද වරද සේ පිළිගත් පමණින් ම වරද නිවරද නොවේ. කුඩා ළමයෙක් නරක ආශ්‍රය නිසා බොරු කීමට පුරුදු වුණේ ය යි සිතමු. ඔහු එය වැරදි ක්‍රියාවක් බව පිළිගත් පමණින් ම ඇත්ත කියන්නෙකු බවට නො පැමිණේ. ළමයා අසත්‍ය බිණීමෙන් මිදෙන්ට තරයේ ම අධිෂ්ඨාන කරගත යුතු යි. ඉනුත් ඔහු සත්‍යවාදියෙක් නොවේ. ඔහු බොරු කීමේ ආදීනව ගැන පොත පතින් බලා ගත යුතු යි. වැඩිහිටියන්ගෙන් අසා දැනගත යුතු යි. බොරු කියන ළමයින්ගේ සමාගමෙන් ඉවත් විය යුතු යි. සත්‍ය ප්‍රකාශ කරන්නන්ගේ සමාජයේ හැසිරිය යුතු යි. බොරුකීමෙන් තමාගේ ආත්ම ගෞරවය කෙලෙසන බව කල්පනා කට යුතු යි. දිවි හිමි කොටත් මුසාවාදයට අසු නොවන බව නිතර මෙනෙහි කළ යුතු යි. සෙල්ලමටවත් බොරු නො කිය යුතු යි. බොරුකීමට පෙළඹෙන අවස්ථාවලට ඉඩ නොදිය යුතු යි. එවැනි අවස්ථාවකට පැමිණුනත් එය පාලනය කොට ගෙන ඉන් ජය ගත යුතු යි. මෙවැනි විවෙචනයක් එවැනි පරීක්ෂාවකදී ප්‍රයෝජනවත් විය හැකි ය.

01. "මම බොරු නොකියන්නට අධිෂ්ඨාන කර ගත්තෙමි. ඒ නිසා ඒ බොරුව නො කියමි.

02. බොරු කියන අයට ලැබෙන විපාක පොත පත බලා හොඳින් දනිමි. බණ අසා හොඳින් ඉගෙන ගත්තෙමි. ඒ බොරුව නො කියමි.

03. දෙමව්පියන් ඉදිරියේ වත් ගුරුවරුන් ඉදිරියේ වත් ස්වාමීන් වහන්සේලා ඉදිරියේ වත් උතුමන් ඉදිරියේ වත් කළ හැකි දෙයක් ද බොරු බස් බිණීම ෟ නැත. ඒ නිසා ඒ බොරුව නො කියමි.

04. බොරුකීම නීච ක්‍රියාවකි. මම එවැනි නීච දේ කරන්නෙක් දල නැත. බොරු කීමෙන් ආත්ම ගෞරවය කිළිටි වේ. මම මගේ ආත්ම ගෞරවය කිළිටි කර ගනිම් දල නැතග ඒ නිසා ඒ බොරුව නො කියමි.

05. මම බෞද්ධ ළමයෙක්මි. නියම බෞද්ධ ළමයි බොරු කියත් ද, නැත. අසත්‍ය බස් කියන්නාට යටත් පිරිසෙයින් පංචශීලය වත් නැත. ඒ නිසා බොරු කීම මට නොහොබිනා දෙයකි. මගේ දෙමව්පියන්ටත්, ගුරුවරුන්ටත් කැළලකි. ඒ සියල්ලට ම වඩා මගේ ආගමට කරන අගෞරවයකි. ඒ නිසා ඒ බොරුව දිවි යතත් නො කියමි. මේ අන්දමට කල්පනා කිරීමෙන් ඒ ළමයාට ඒ වරදින් මිදී සිටින්නට පුළුවන.

දැන් ළමයා බොරුවෙන් මිදුණා පමණ යි. නැත් නම් වරදක් නොකර හැරියා පමණ යි. කට යුත්ත තව ම සම්පූර්ණ නැත. ඉතින් නිවරද පුහුණු කළ යුතු යි. ඒ සඳහා තමා අත්හළ දුසිරිතේ ප්‍රතිවිරුද්ධ සුසිරිත දැන් පුරුදු කළ යුතු යි. එනම් හැම විට ම සත්‍යය ම ප්‍රකාශ කිරීම යි. කොපමණ සත්‍යයක් වුවත් එය ප්‍රකාශ කිරීමේ යම් අනර්ථයකට හේතුවේ නම් එවැනි තැන දී, නිශ්චලතාවේ වැදගත් කම ද දැන ගත යුතු යි. මේ අන්දමට වරදින් මිදීමේ හා නිවරද පුහුණු කිරීමේ ක්‍රමවත් පිළිවෙළක් ඇති කරගත් විට අපගේ ක්‍රියාවල් ද කථා බහ ද සිතිවිලි ද ක්‍රමයෙන් නිවැරදි බවට පමුණුවා ගත හැකි වේ.

තමා කළ වරද නොපිළිගෙන අනුන් පිට තබා අත බේරා ගැනීම ද නීච ගතියකි. නෑදෑයෙකු හෝ අසල් වැසියෙකු හෝ වෙන යම් කෙනෙකු පිට වරද පටවන්නට බැරිවුණ තැනදී ඇතැම් අය කර්මය පිට හෝ කේන්ද්‍රය පිටවත් දෝෂය තබා තමා ගැලවෙන්නට සූදනම් වේ. සමහර හීන දීන නිලධාරීහු යටත් මෙහෙකරුවන් පිට දෝෂය පවරා තමා ඉන් බේරේ. එවැනි නිලධාරීන්ගෙන් වරදක් සිදු වූ විට ඔවුන්ට ඇතිවන එකම කල්පනාව නම්" මීට බිල්ලට දෙන්නේ කවුද?" යනු යි. එය තමාගේ නිලයට කෙසේ වුණත් මනුෂ්‍ය ගතියටත් කැළලකි. අපහාසයකි. හොඳ ළමයා මෙවැනි බියකරු දෙයින් ප්‍රවේසම් විය යුතු යි. තමාගෙන් වුන වරද අහිංසක මල්ලී

හෝ නංගී පිට තබන්නට තැත් කරන ළමයා චපලයෙකි. කෲරයෙකි. සහෝදර ද්‍රෝහියෙකි. තමාගෙන් වරදක් වූ විට"එය මගේ වරද තමා, මම ඊට කනගාටුයි. මීට පසු එසේ නොකරන්නෙමි" යි වරද බාර ගන්නා කුඩා ළමයා මහාත්මයෙකි. වීරයෙකි. කුඩා කල සිට ම බෞද්ධ ළමයා ඊට පුරුදු විය යුතු යි.

වරද වරද සේ පෙනුනත්, එය වරද යයි ප්‍රකාශයේ කීමට හෝ ඊට විරුද්ධව ක්‍රියා කිරීමට ඇතැම් විට අවකාශ නොලැබේ. යම් ආණ්ඩුවක ප්‍රතිපත්තියක් හෝ ක්‍රියා පටිපාටියක් එහි අමාත්‍යයෙකුට හෝ නිලධාරියෙකුට වැරදි සේ හැඟෙන්ට පුළුවන. එවැනි තැන දී රාජ පාක්ෂික භාවය නිසා හෝ වෙන යම් වැදගත් ප්‍රතිපත්තියක් නිසා කලකට වත් වරද දැක දැකත් නිසොල්මන් වන්නටත් ඉවසිලි වන්තව ක්‍රියා කරන්නටත් සිදු වේ. එහෙත් රටේ කැලඹීමක් නොවන අන්දමට තම අදහස් නිදහස් ලෙස ප්‍රකාශ කොට හෝ නොකොට ආණ්ඩුවෙන් අස් විය හැකි නම් වඩා හොඳ ක්‍රියා මාර්ගය එය වේ. මෙ වැනි දේ ආණ්ඩුවල බොහෝ විට සිදු වේ. ආත්ම ගෞරවය උතුම් කොට සලකන උතුමෝ මොහොතකට වත් වරද නොකරත්.

තමාගේ දහස් වරදක් තිබිය දී අනුන්ගේ එක වරද සොයන්නෝ දුන් රටේ බහුල ය. අනුන්ගේ දොස් ගැන සෙවීමෙහි තත්පර වූ පුද්ගලයාට තමාගේ අඩු පාඩුකම් ගැන සොයන්නට කාලයක් නැත. තවද නිතර ම අනුන්ගේ දෙස් කෙරෙහි සිත යොමු කිරීම නිසා දෙස් සෙවීම ඔහුගේ අභ්‍යන්තරයෙහි මුල් බැසගන්නා පුරුද්දක් වේ. මෙසේ නිතර දෙවේලේ අනුන්ගේ ඇද කුද, ඕපා දූප, හා අඩු පාඩු ගැන විපරම් කිරීමේ නිරත වූ මේ තැනැත්තාට යහපත පෙනීම ක්‍රමයෙන් නුහුරු දෙයක් වේ. එබැවින් ඔහු නොදනුවත්ව ම ඔහුගේ ජීවිතයද වරදින් පිරීයයි. ඔහුගේ පරිහානිය එතැනින් පටන්ගනී.

අනුන් නිසි මඟ හරවන පරිදි ඔවුන්ගේ දෙස් සොයා කරුණාවෙන් පෙන්වා දීම වරදක් නොවේ. එසේ කන්නා වරද කළ අයට ම වරද සෙමින් පෙන්වා දිය යුතුයි. කෙනෙකුගේ වැරදි අනිකෙකුට කියා පෑමෙන් වරද කළ අයට යහපතක් නොවේ. අපහාස පෑමෙන් වරද කළ අයට යහපතක් නොවේ. අපහාසයක් වශයෙන් හෝ දෝෂාරෝපණයක් වශයෙන් හෝ දඬුවමක් වශයෙන් වරද පෙන්වා දීමෙන් ද වරද කළ අයට වැඩක් නොවේ. වරදක් කළ කුඩා ළමයාගේ ඒ වරද නිවරද කිරීමේදී ඔහුට බැණ වැදීම, ගර්හා කිරීම හෝ දඬුවම් කිරීම ඇතැම් මෝඩ දෙමව්පියන් ගේ හා ගුරුවරුන්ගේ ද අසභ්‍ය සිරිතකි.

එබැවින් හොඳ ළමයා තම කුඩා මිතුරන්ගේ වැරදි කරුණාවෙන් ඔවුන්ට ම පෙන්වා දෙනවා ඇත. තමා වරද කරන්නෙක් නම් අනුන්ට බණ කියන්ට ඉඩ නැත. එබැවින් ප්‍රථම කොට ම තමා හැකි තරම් යහපතෙහි යෙදෙන්නෙක් විය යුතුයි. ඉන්පසු තමාගේ මනා ආශ්‍රයෙන් හා කාලෝචිත උපදේශයෙන් ද තම කුඩා නෑදෑ මිතුරනුත් යහපත් අය කරගත හැකි ය. එවිට හොඳ ළමයා නියම කල්‍යාණ මිත්‍රයෙක් වන්නේ ය.

තමා නිසි මඟට බැස, පරහටත් ඒ මඟ පෙන්වා දීම බුදු සිරිතයි. එබැවින් විශේෂයෙන් ම අප බෞද්ධ ළමයි ශක්ති පමණින් වරදින් මිදී සිටින්නටත් යහපත කරන්නටත් අනුන් වරදින් මුදවාගන්නටත් ඔවුන් යහපතෙහි යොදවන්නටත් නිතර ම වීර්ය කළ යුතු යි. මේ අභිනව බුද්ධවර්ෂයේ දී මේ අධිෂ්ඨානය ඇතිකර ගන්න! එය අනුගමනය කරන්න. ඉන් බෞද්ධ ලෝකය ආලෝක කරන්න! ඒ සත් ව්‍යාපාරයේදී බෞද්ධ ළමයා ද සිය යුතුකම නො පිරිහෙළා ඉටුකරනවා ඇත.



# සිරිමත් සිරි දම්පල් උතුමාණෝ....!

ශාස්ත්‍රවේදී පූජ්‍ය
කුරුණෑගල චරණධම්ම හිමිපාණන් විසිනි.

ශ්‍රේෂ්ඨ වීරවරු ජාතියකට නිතර පහළ නොවෙති, සුලභ නොවෙති. සිංහල ජාතියකට පහළ වූ එවන් දුර්ලභ ගණයේ සැබෑ වීරවරයෙකි අනගාරික ධර්මපාල සිරිමතාණෝ. විදේශයන්හි ආධිපත්‍යයට දිගු කලක් යටත්ව පැවතීමෙන් පිරිහී තිබූ සිංහලයන්ගේ ජාතික, ආගමික, සමාජීය හා සංස්කෘතික උරුමයන්ගේ පණ ගැන්වීමටත් ශිෂ්ට සම්පන්න ජාතියකට ලෙස උරුම වී තිබූ සදාචාරවත් පරෝපකාරී ජීවන ක්‍රමය යළි නඟා සිටුවීමටත් ඒ පිළිබඳ අභිමානය ඇති කිරීමටත් අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කළ මහා යුග පුරුෂයෙකු ලෙස එතුමා හැඳින්වීමේ වරදක් නැත.

1864 සැප්තැම්බර් 17 වන දින අගනුවර ප්‍රසිද්ධ ව්‍යාපාරිකයකු වූ දොන් කරෝලිස් හේවාවිතාරණ මුදලිතුමාටත් සැදැහැවත් උපාසිකාවක වූ මල්ලිකා හේවාවිතාරණ ළමාතැනීටත් පුත්ව උපන් මෙම පින්වත් කුමරුවා දොන් ඩේවිඩ් හේවාවිතාරණ නම් විය. සිය ළමා අවධියේදී ක්‍රිස්තියානි පාසල්වල අධ්‍යාපනය ලබා ගැනීමට සිදුවුවත් දෙමාපියන් ගේ මනා මඟපෙන්වීම අනුව ලැබූ බෞද්ධාගමික හුරුව නිසාත් පොහොය අටසිල් සමාදන් වීමෙන් ලැබූ පුහුණුව නිසාත් නියම හෙළ බොදු

දරුවෙකු වීමට එතුමා භාග්‍යසම්පන්න විය.

කොටහේන දීපදුත්තාරාම විහාරය සමග තිබූ සමීප සබඳතාවත්, ඒ නිසාම ඇති වූ හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා සමග සබඳතාවත් සිය පරපුරේ ධන ශ්‍රම පරිත්‍යාගයෙන් තැනුණු මහ විදු පියස වූ කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනින් බිහිවූ ශ්‍රේෂ්ඨ පඬි මිණි පහන වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමියන් සහ හෙයියන්තුඩුවේ දේවමිත්ත හිමියන්ගෙන් ලද පාලි සිංහල භාෂා ඥනයත් හේවාවිතාරණ තරුණයාගේ ජීවිතය වෙනස් කිරීමට හේතුවන්නට ඇත. පරමවිඥනාර්ථ සමාගමේ සඟරා පරිශීලනයෙන් තව තවත් සිය දැනුම් පිපාසය සංසිඳවා ගැනීමටත්, නවීන දැනුමින් සන්නද්ධ වන්නටත් උපකාරී විය. මේ සියලු කාරණාවන් ඒකරාශී වීමෙන් ලද ඥන සම්භාරය, පරිචය, දේශ වාත්සල්‍යය, ආගමාලය හේතුවෙන් 1886 වන විට හේවාවිතාරණ තරුණයා දොන් ඩේවිඩ් යන බටහිර නම අතහැර ධර්මපාල නම් වූ ආර්යය සිංහල නාමය ලබාගත් අතර අනගාරික බවට ද පත් විය. එතැන් පටන් එම ජීවිතයට කැපවූයේ සිංහල ජාතියත් බෞද්ධාගමත් රැකගැනීම වෙනුවෙනි.

1981 මහාබෝධි සමාගම පිහිටුවා සමස්ත බෞද්ධ ජනතාවට ම අහිමිව තිබූ අන්තවාදී හින්දු ග්‍රහණයට ලක්ව තිබූ බුද්ධග යා පුදබිම බේරා ගැනීමේ මහා මෙහෙයුම අරඹන ලදී. මේ අතර ජාත්‍යන්තර වශයෙන් දේශන කීපයක් පැවැත්වීමටත් සමුළුවලට සහභාගී වීමට තරම් ධෛර්ය සම්පන්න ධර්මපාල තුමාගේ ඍජු චතුර වාග් විලාසය කාගේත් සිත් ඇද ගන්නා සුලු ස්වරූපයක් ගෙන තිබුණි. මෙම ඍජු චතුර වාග් ප්‍රහාරයන් තුළින් තම ජාතියේ තිබූ පරගැති චර්යාවන් සිරිත් විරිත් පමණක් නොව බටහිර නම් ගම්, ඇඳුම් පැළඳුම් පවා නැවත හෙළ සංස්කෘතික අනන්‍යතාවට හැරවීමට එතුමා සමත් විය.

1906 දී සිංහල බෞද්ධයා පුවත් පත අරඹා "දැනගත යුතු කරුණු" නමින් සතිපතා පළ කළ ලිපි පෙළ තුළින් එතුමන් තුළ ආර්ථික, දේශපාලන ආදී ක්ෂෙත්‍රයන් පිළිබඳව තිබූ පළල් ඥානයත් සිංහල සංස්කෘතිය සහ ආගම නගා සිටුවීමේ බරපතල අපේක්ෂාවත් දේශපාලන, ආර්ථික ස්වාධීනතාව ලබා ගැනීමේ අවශ්‍යතාවත් මනාව ප්‍රකට කර තිබේ. ලංකාව පුරාම දෙසුම් පවත්වමින් සිය ජාතිය නගා සිටුවීමට පුදුම සහගත කැපකිරීමක් කොට සිය දිවියේ පශ්චිම කාලයේ දී 1931 දී සිරි දේවමිත්ත ධම්මපාල නමින් උතුම් පැවිදි දිවියට පත් වූ එතුමාණෝ 1933 දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට පත්වූහ. පරහිතකාමී ගුණ වලින් යුතු බෝසත් දිවියක් ගෙවූ සිරි දේවමිත්ත ධම්මපාල හිමියෝ 1933 අප්‍රේල් මස 29 වන දින බරණැස මූලගන්ධ කුටි විහාරයේදී මෙලොවෙන් නික්ම පරලොව සුව සෙවූහ.

මෙවන් ශ්‍රේෂ්ඨ වීරවරයන් බිහිවූ රටක ජාතියක ආගමක උපන් දරුවන් ලෙස ඔබ සතු වගකීම හා යුතුකම වන්නේ එම වීර චරිතවලින් තම දිවිය පොහොසත් කර ගැනීමයි. විශේෂයෙන් මේ ගෙවී යන අනගාරික ධර්මපාල තුමන්ගේ 150 වන උපත් සැමරුම් වසරේදී, ධර්මපාල තුමන්, ගිහි දරුවන්ට දුන් අගනා උපදේශ වූ ගිහි දින චර්යාව වැනි දෑ අනුගමනය කිරීමට පෙළ ගැසීමයි. උදෑසන අවදි වීමේ පටන් ආහාර අනුභවය වස්ත්‍ර ඇඳීම ආදී සියල්ල පිළිවෙළින් සිදුකරන ආකාරය ඇතුළත් මෙම චර්යා පද්ධතිය පොතපත පරිශීලනයෙන් උගත හැකිවේ.

වත්මන් දරුපරපුරට ධර්මපාල උතුමාණන් හට උපහාර දැක්වියහැකි වන්නේද එතුමා පැවසූ පරිදි, රට ජාතිය ආගම භාෂාව යන රත්න සතර රැකගැනීම තමාගේ පරම යුතුකම කොට සලකා ධර්මපාල චින්තනයෙන් තම දිවිය පොහොසත් කරගැනීමෙනි.



# උදා සිරි

විශ්‍රාමලත් පාඨශාලාචාර්ය
ඩී. පී.බී. ඇල්ලේපොළ සූරින් විසිනි.

බොදු ළමා පිළිවෙ ත
වෙතැ යොමා ඔබ නෙත සිත
"බොදු ළමයා" බල ත
වහා වැටහේ කරුණු සැක නැ ත

ළයට පෙනහලුව ට
පිවිතුරු බවක් පළ කො ට
දිගාසිරි විඳුම ට
පහන් දොර එයි අපේ පිහිට ට

විහඟුන් රැව් නඟන
සුසුදු හිරු රැස් විහිදෙන
සුවඳැති නල හමන
උදය සැපතෙකි අපට අපමණ

හිමිදිරි උදෑ සන
පිබිදී තුටින් ඉපිලෙන
දරුවනි, ඔබ දියුණ
නියති, නැහැ එන ළහිරු විලසින



# නාමසිද්ධි ජාතකය

**විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂ්මි පෙරේරා මහාත්මනිය විසිනි**

මහාකාරුණික අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල, නාම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කරගත් එක් භික්ෂූන් වහන්සේ නමක් උදෙසා මෙම ජාතක ධර්මය වදාළ සේක.

එක් කුලවත් පවුලක උපන් 'පාපක' නම් කුල පුතු, බුදු දහම කෙරෙහි පැහැදී මහණ දම් පිරී ය. සහෝදර භික්ෂූහු "පාපක මෙහි එන්න, පාපක මෙතන අසුන් ගන්න, පාපක යන්න" යනුවෙන් පැවසූවාහු ය. පාපක භික්ෂූන් වහන්සේ තම නාමයට අකමැති වූහ. මෙම නම අමිහිරි ය, අවමංගල ය යනුවෙන් සිතූහ. ඒ තමන් වහන්සේ පවින් මිදී සිටියත් නම පාපක නිසා ය. තම නම වෙනස්කර මංගල යැ යි සම්මත නමක් ලබා දෙන ලෙස තම ආචාර්යයන් වහන්සේට පවසා සිටියහ.

"ඇවැත්නි, නාමය ඔබ හඳුනාගැනීම සඳහා යොදා ගන්නා වචනයක් පමණකි. එය සම්මුතියක් පමණයි. තම කර්මය අනුව සිදුවන දෑ, තමන්ගේ ක්‍රියාවන් නම හා සම්බන්ධ කළ නොහැකි බව නොදන්නේ දැයි විමසා සිටියහ. නමුත් පාපක

භික්ෂුව නැවත නැවතත් නාමයන් ඉල්ලා සිටියෙන් නාමසිද්ධි භික්ෂූන් වහන්සේ නමින් ප්‍රසිද්ධ විය.

දෙව්රම්හි දම්සභාවෙහි 'පාපක' නාමය පිළිබඳව භික්ෂූන් වහන්සේලා අතර කතිකාවකට බඳුන් විය. බුදුරජාණන් වහන්සේ එහි වැඩම කරනා ලදුව, මෙම කතිකාවට තුඩු දුන් පුවත ගැන දැනගත් සේක. පෙර ආත්මයකදී පවා පාපක භික්ෂුව හට නාමය ගැන ප්‍රශ්නය ඇතිවිණැයි පවසා අතීත කථාව වදාළ සේක.

පෙර කල අප මහ බෝසතාණෝ තක්සලා නුවර දිසාපාමොක් ආචාර්යයන් ලෙස පන්සීයයක් සිසුනට උගන්වති. එක තරුණ සිසුවකු ගේ නම පාපක විය. යහළුවෝ, ඇදුරුතුමන් ඔහුට පාපක නමින් ආමන්ත්‍රණය කළහ. මෙවැනි පාපී, අවමංගල නාමයක් වෙනුවට මංගල කරුණක් හා සම්බන්ධ නමක් ගත යුතු යැ යි තම ඇදුරුතුමා හට පැවැසීය. එවිට දිසාපාමොක් ආචාර්යයන් "රට වටා ගොස් සිතට ගැළපෙන නමක් සොයාගෙන පැමිණෙන්න, එවිට වෙනස් කර දෙමි" යි කීහ.

පාපක එක් ගමකට ගිය විට නෑදෑයන් පිරිසක් මියගිය තැනැත්තකු ඔසවා ගෙන යනු දැක්කේ ය. මියගිය තැනැත්තා කවරෙක් ද යි පාපක විමසූ විට, ඔවුන් පවසා සිටියේ ඔහු නමින් ජීවක බවයි. ජීවකත් මියයන බව අසා පාපක කම්පා විය."ජීවකත්, අජීවකත් මිය යන බව නොදන්නේ ද? ඔබ අඥානයෙකු විය යුතු යි" නෑදෑයෝ පැවසූහ.

තරමකට නම ගැන අවබෝධ කරගත් පාපක නගරය දෙසට යනවිට, නිවසක් ඉදිරිපිට දාසියකට දඬුවම් කරන හාම්පුතකු දුටුවේ ය. ඇයගේ වරද කුමක් ද යි ඇසූ පාපකට පිළිතුරු වශයෙන් ලැබුණේ නිසිලෙස වැඩ නොකරන බවයි.

ඇය නමින් ධනපාලි බව ඔහු කීවේ ය. ධනය පාලනය කරන්නී යන අරුත ඇති ධනපාලිත්, අධනපාලිත් දෙදෙනාම දුප්පත්වීම පාපකට පුදුමයකි. මොහු මොඩයෙකු විය යුතු යි මිනිස්සු කීහ.

එතැනින් නික්ම මග දිගේ ඇවිදගිය පාපකට මං මුළාවූ මිනිසෙක් මුණ ගැසිණ. ඔහුගෙන් නම ඇසූ විට පන්ථක යැ යි කීවේ ය. පන්ථක මෙන් ම අපන්ථකත් මං මුළාවන්නේ කෙසේ දැ යි විමසූ පාපකට මිනිස්සු සිනාසුණහ.

නාමය ගැන මැදහත් ලෙස සිතන්නට වූ පාපක, දිසාපාමොක් ඇදුරුතුමා හට පැවැසුයේ නමින් ජීවක වුව ද මියයන බවත්, ධනපාලි දුගී වන බවත්, පන්ථක මංමුළාවන බවත් ය. "දැන් ඔබටත් නාමය යනු සම්මුතියක් බව වැටහේ දැ යි ඇදුරුතුමා ඇසූ විට එය අවබෝධ කරගත්, පාපක නම වෙනස් කිරීමට ඇවැසි නො වේ යැ යි පැවසී ය.

කෙනෙකුගේ ජීවිතය, කර්මය විසින් තීන්දු කරන බවත්, නාමයෙන්, ජීවිතය හෝ තමන්ගේ ක්‍රියාව හෝ තීන්දු නොකරන බව අවබෝධ කරගත යුතු බව දිසාපාමොක් ඇදුරුතුමා පැවසීය. අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ මේ අතීත පුවත දන්වා පාපක නොහොත් නාමසිද්ධි මාණවකයා මෙකල නාමසිද්ධි භික්ෂූන් වහන්සේ බවත් දිසාපාමොක් ආචාර්ය තෙමේ තමන්වහන්සේ යැ යි වදාළ සේක. සිසු පිරිස දැන් බුදු පිරිස බවත් පවසා සිටියහ.

නාමසිද්ධි ජාතකය අපහට නාමය හා කෙනෙකුගේ ජීවිතය අතර ඇති සමානතාවයක් නොමැති බවත්, කෙනෙකු නාමයෙන් මැනිය නොහැකි බව පෙන්වා දේ.